**01. මනුෂ්‍ය ඝාතනයක් - ඇහැලියගොඩ පොලිස් වසම.**

2024.12.27 වන දින උදෑසන කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ බුළුගහපිටිය ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහර දී කාන්තාවක් ඝාතනය කර ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත ඇහැලියගොඩ පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 60 ක් වූ බුළුගහපිටිය, ඇහැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පවුල් ආරවුලක් දුරදිගයාම හේතුවෙන් මරණකාරියගේ දියණියගේ ස්වාමි පුරුෂයා විසින් මෙම ඝාතනය සිදු කර බවට විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර, ඝාතනයෙන් පසු සැකකරු ප්‍රදේශයෙන් පලා ගොස් ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.27 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ෆර්ගියුෂන් පාර ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 150 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.12.27 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සේදවත්ත ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.

2024.12.27 වන දින දහවල් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.12.27 වන දින දහවල් කාලයේ මාදම්පිටිය පොලිස් වසමේ මෙත්සඳ සෙවණ ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 510 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොච්චියාගම පොලිස් ස්ථානය.

2024.12.27 වන දින දහවල් කාලයේ නොච්චියාගම පොලිස් වසමේ කොකුන්නෑන ප්‍රදේශයේදී නොච්චියාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන රනෝරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුවරසම්කුලම් පොලිස් ස්ථානය.

2024.12.27 වන දින රාත්‍රී කාලයේ පුවරසම්කුලම් පොලිස් වසමේ සෙංගල්පඩෙයි ප්‍රදේශයේදී පුවරසම්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන වේලන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුවරසම්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සිදම්බරපුරම් පොලිස් ස්ථානය.**

2024.12.27 වන දින උදෑසන කාලයේ සිදම්බරපුරම් පොලිස් වසමේ කට්කුලම් ප්‍රදේශයේදී සිදම්බරපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිදම්බරපුරම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - කොට්ටාව පොලිස් වසම.**

2024.12.27 වන දින රාත්‍රී කාලයේ කොට්ටාව පොලිස් වසමේ හයිලෙවල් මාර්ගයේ පන්නිපිටිය ප්‍රදේශයේදී, පන්නිපිටිය දෙස සිට කොට්ටාව දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගය අයිනේ නවතා තිබූ කන්ටේනර් රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරු පැදිකරු හෝමාගම රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ බ්‍රාහ්මණගම, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් කන්ටේනර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කොට්ටාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.**

2024.12.27 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ පලාපත්වල ප්‍රදේශයේදී, මාතලේ දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන්කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ කාන්තාව මාතලේ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 59 ක් වූ පලාපත්වල, මාතලේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සම්බන්ධයෙන් කාර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**